ශ්‍රී රාහුල විද්‍යාලය/කටුගස්තොට
ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයන
11 ශ්‍රේණිය A/B

සැකසුම-Y.A.H.සේනාරත්න. කාලය පැය 2

පහත දක්වා ඇති ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයන පෙළ පොතේ පිටු කියවා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## 4.1 මූල්‍ය ප්‍රකාශන හැඳින්වීම

ගිණුම්කරණ ක්‍රියාවලියේ දී ව්‍යාපාරික ගනුදෙනු මූලික සටහන් පොත්වල වාර්තා කිරීමෙන් පසු ව ලෙජර් ගිණුම්වලට පිටපත් කරන ආකාරයත් එම ලෙජර් ගිණුම් තුලනය කර ලබාගන්නා ශේෂ ඇතුළත් කර ශේෂ පිරික්සුමක් පිළියෙල කරන ආකාරයත් 10 වන ශ්‍රේණියේ පාඩම්වලින් ඉදිරිපත් කර ඇත.

බොහෝ ව්‍යාපාරවල අපේක්ෂාව වන්නේ ලාභ ලබමින් තම ව්‍යාපාරික කටයුතු සාර්ථක ව පවත්වා ගෙන යාමයි. මෙහි දී උපයාගත් ලාභය හෙවත් ඉපැයූ මෙහෙයුම් ප්‍රතිඵලය ප්‍රමාණවත් මට්ටමක පවතී ද යන්න සොයා බැලීම වැදගත් වේ. තව ද ව්‍යාපාරයේ වත්කම්, හිමිකම සහ වගකීම්වලින් පෙන්නුම් කරන මූල්‍ය තත්ත්වය ද දැනගැනීම වැදගත් වේ. මෙහෙයුම් ප්‍රතිඵලය සහ මූල්‍ය තත්ත්වය දැනගත හැක්කේ මූල්‍ය ප්‍රකාශන මගින් ය.

ගිණුම් කාලච්ඡේදය තුළ ව්‍යාපාරය විසින් අත් කරගෙන ඇති මෙහෙයුම් ප්‍රතිඵලය අනාවරණය කර ගැනීමටත්, මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීමටත් හැකි වන සේ පිළියෙල කරන වාර්තා මූල්‍ය ප්‍රකාශන නම් වේ.

ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ යම් නිශ්චිත කාලච්ඡේදයක් ආවරණය වන පරිදි ය. එය ගිණුම් කාලච්ඡේදය ලෙස හැඳින්වෙන අතර මෙය සාමාන්‍යයෙන් වර්ෂයක කාල සීමාවකි. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ක්‍රියාවලියේ නිමැවුම වේ.




විවිධ ව්‍යාපාර සංවිධාන සඳහා විවිධ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අතර තනි පුද්ගල වෙළෙඳ ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන 02ක් පිළිබඳ ව පමණක් අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් සිදු කෙරේ.

තනි පුද්ගල වෙළෙඳ ව්‍යාපාරයක් විසින් එහි මෙහෙයුම් ප්‍රතිඵලය සහ මූල්‍ය තත්ත්වය දැනගැනීමට ගිණුම් කාලච්ඡේදයක් සඳහා පිළියෙල කරන ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන දෙකකි.

01. ලාභ හෝ අලාභ ප්‍රකාශනය
02. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 4.2 ලාභ හෝ අලාභ ප්‍රකාශනය

වෙළෙඳ ව්‍යාපාරයක් විසින් ගිණුම් කාලච්ඡේදය තුළ ඉපැයූ ලාභය හෝ අලාභය ගණනය කර ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන වාර්තාව ලාභ හෝ අලාභ ප්‍රකාශනය නම් වේ. මෙම ප්‍රකාශනය අතීතයේ දී ආදයම් ප්‍රකාශය යනුවෙන් හඳුන්වනු ලැබූ ව ද වර්තමානයේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශනය ලෙස භාවිත කරනු ලැබේ.

වෙළෙඳ ව්‍යාපාරයක් විසින් උපයාගත් ලාභය හෙවත් ඉපැයූ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම පියවර දෙකකින් සිදුවේ.

01. දළ ලාභය ගණනය කිරීම
02. ශුද්ධ ලාභය ගණනය කිරීම

### 01. දළ ලාභය ගණනය කිරීම

දළ ලාභය ගණනය කරන්නේ විකුණුම් ආදයමින් විකුණූ භාණ්ඩවල පිරිවැය අඩු කිරීමෙනි.

#### විකුණුම් ආදයම

ගිණුම් කාලච්ඡේදය තුළ සිදු කරන ලද අත්පිට විකුණුම් හා ණයට විකුණුම් යන දෙකෙහි එකතුව විකුණුම් ආදයම වේ.

**නිදසුන** :-

| | රු. |
|---|---|
| අත්පිට විකුණුම් | 58 000 |
| ණයට විකුණුම් | 76 000 |
| විකුණුම් ආදයම | 134 000 |

#### විකුණුම් පිරිවැය (විකුණූ භාණ්ඩවල පිරිවැය)

විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගය සම්පූර්ණයෙන් ම විකුණා ඇති විටෙක එම විකුණන ලද භාණ්ඩ තොගයෙහි පිරිවැය විකුණුම් පිරිවැය වේ. එහෙත් යම් ව්‍යාපාරයක අදාළ කාලච්ඡේදය අවසාන වන විට නොවිකිණී ඉතිරි ව ඇති භාණ්ඩ තොගයක් ද තිබිය හැකි ය. එවිට විකිණීම සඳහා ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැයෙන් නොවිකිණී ඇති ඉතිරි බඩු තොගයේ වටිනාකම අඩු කළ විට විකුණුම් පිරිවැය ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එක් ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ නොවිකිණී ඇති ඉතිරි බඩු තොගය අවසාන තොගය ලෙස හඳුන්වන අතර එය වත්කමක් ලෙස සලකනු ලැබේ. එය ඊළඟ ගිණුම් කාලච්ඡේදයේ ආරම්භක තොගය වේ.

**නිදසුන්** :-

2015.12.31 දිනට පැවති අවසාන ඉතිරි බඩු තොගය ඊළඟ ගිණුම් කාලපරිච්ඡේදයේ අරම්භය වන 2016.01.01 දින ආරම්භක තොගය වේ.

අලුතින් ආරම්භ කළ ව්‍යාපාරයක නම් ආරම්භක තොගයක් නොපවතියි.

ගිණුම් කාල සීමාව තුළ විකිණීම සඳහා ආරම්භක තොගය ප්‍රමාණවත් නොවන බැවින් භාණ්ඩ අලුතින් මිල දී ගත යුතු ය. එලෙස සිදු කෙරෙන අත්පිට ගැනුම් හා ණයට ගැනුම් යන දෙකෙහි එකතුව මුළු ගැනුම්වල වටිනාකම බවට පත් වේ.

**නිදසුන** :-

| | රු. |
|---|---|
| අත්පිට ගැනුම් | 24 000 |
| ණයට ගැනුම් | 58 000 |
| මුළු ගැනුම් | 82 000 |

මිල දී ගත් භාණ්ඩ ව්‍යාපාරික ස්ථානය කරා ගෙන ඒමේ දී තවත් වියදම් දැරීමට සිදු වේ. ගෙන ඒමේ කුලී, පැටවුම් ගාස්තු ඊට නිදසුන් ය. වර්ෂය තුළ ලබාගත් තොගයේ මුළු පිරිවැය ගණනය කිරීම සඳහා ගැනුම්වලට අදාළ තොගය විකිණිය හැකි තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒමට දරන ලද වියදම් සියල්ල එකතු කළ යුතු ය.

**නිදසුන** :-

| | රු. |
|---|---|
| ගැනුම් | 82 000 |
| පැටවුම් ගාස්තු | 6 000 |
| ගෙන ඒමේ කුලී | 9 000 |
| මිල දී ගත් තොගයේ මුළු පිරිවැය | 97 000 |

මේ අනුව විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී පහත සඳහන් අයිතම සැලකිල්ලට ගනී.

- ආරම්භක තොගය
- අත්පිට හා ණයට මිල දී ගත් තොගයේ මුළු පිරිවැය
- අවසාන තොගය

**නිදසුන** :-

වෙළෙඳ ව්‍යාපාරයක පහත සඳහන් තොරතුරු පවතී.

| | රු. |
|---|---|
| ආරම්භක තොගය | 15 000 |
| ගැනුම් | 82 000 |
| පැටවුම් කුලී | 6 000 |
| ගෙන ඒමේ කුලී | 9 000 |
| අවසාන තොගය | 22 000 |

ඉහත තොරතුරුවලින් විකුණුම් පිරිවැය ගණනය කරන අන්දම පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ආරම්භක තොගය | 15 000 |
| ගැනුම් | 82 000 |
| පැටවුම් කුලී | 6 000 |
| ගෙන ඒමේ කුලී | 9 000 |
| විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය | 112 000 |
| අඩු කළා: අවසාන තොගය | (22 000) |
| විකුණුම් පිරිවැය | 90 000 |

## දළ ලාභය

දළ ලාභය යනු විකුණුම් ආදායමින් විකුණුම් පිරිවැය අඩු කළ පසු ලැබෙන ශේෂය වේ.

**දළ ලාභය/දළ අලාභය = විකුණුම් ආදායම - විකුණුම් පිරිවැය**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

විකුණුම් ආදයම විකුණුම් පිරිවැයට වඩා වැඩි නම් එම වැඩි වූ ප්‍රමාණය දළ ලාභය වේ.

**නිදසුන :-**

විකුණුම් ආදයම රු. 134 000ක් ද විකුණුම් පිරිවැය රු. 90 000ක් ද නම් දළ ලාභය රු. 44 000කි.

| | | | |
|---|---|---|---|
| විකුණුම් ආදායම | - විකුණුම් පිරිවැය | = | දළ ලාභය |
| 134 000 | - 90 000 | = | 44 000 |

විකුණුම් ආදයම විකුණුම් පිරිවැයට වඩා අඩු නම් එම අඩු ප්‍රමාණය දළ අලාභය වේ.

**නිදසුන :-**

විකුණුම් ආදයම රු. 134 000ක් ද විකුණුම් පිරිවැය රු. 140 000ක් ද නම් දළ අලාභය රු. 6 000කි.

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් ආදායම | - | විකුණුම් පිරිවැය | = | දළ ලාභය |
| 134 000 | - | 140 000 | = | (6 000) |

<u>ප්‍රශ්නාවලිය</u>

1. මූල්‍ය ප්‍රකාශ යනු මොනවාද?
2. ගිණුම් කාලපේදයක් ලෙස හඳුන්වන්නේ කුමක්ද?
3. ගිණුම්කරණ ක්‍රියාවලියේ යෙදවුම් හා නිමවුම් මොනවාද?
4. ගිණුම්කරණ ක්‍රියාවලියේ ඇතුලත් උප ක්‍රියාවලීන් මොනවාද?
5. තනි පුද්ගල ව්‍යාපාර පිලියෙල කරන ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන මොනවාද?
6. ලාභ හෝ අලාභ ප්‍රකාශය යනු කුමක්ද ?
7. ව්‍යාපාරයක් ඉපයූ ලාභය හෝ මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීමේ පියවර ලියන්න.
8. දළ ලාභය ගණනය කරන්නේ කෙසේද?
9. විකුණුම් ආදායමට අතුලත් වන්නේ මොනවාද?
10. විකුණුම් පිරිවැය ( විකුණු භාණ්ඩවල පිරිවැය) යන්න කෙටියෙන් හඳුන්වන්න.
11. විකුණුම් පිරිවැය ගණනය කරන්නේ කෙසේද?
12. අවසාන තොගය යනු කුමක්ද?
13. අලුතින් ආරම්භ කල ව්‍යාපාරවල ආරම්භක තොගය ලබාගන්නේ කෙසේද ?
14. සමන්ගේ ව්‍යාපාරයේ 2018/12/31 දින රුපියල් 5000 අවසාන තොගයක් පැවතිනි. 2019/01/01 දිනෙන් ආරම්භ වන ගිණුම් කාලපේදයේ සමන්ගේ ව්‍යාපාරයේ ආරම්භක තොගය කොපමණද ?
15. ව්‍යාපාරයක විකිණීම සඳහා ආරම්භක තොගය පමණ ප්‍රමාණවත් නොමැති විට ව්‍යාපාරයට කුමක් කල හැකිද?
16. මුළු ගැනුම් ගණනය කරන්නේ කෙසේද ?

<u>ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමුකරන්න</u>

- පිලිතුරු තමන්ගේ සටහන් පොතේ ලියා දක්වන්න.
- එම පිලිතුරු පාසල ආරම්භ කල පසු පාසලට පැමිණෙන විට රැගෙන ආ යුතුය.
- 2020/05/11 දිනට පෙර ඉහත පැවරුම නිමකලයුතුය.